**ගලිගමුව ප්‍රාදේශීය සභාව - 2020**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

ගලිගමුව ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(i)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(i)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් මිලදී ගත් වර්ෂයේදී සම්පූර්ණ පිරිවැය ප්‍රාග්ධන වියදම් යටතේ ලියා හැර තිබියදී වාර්ෂිකව ක්ෂය ලෙස රු.4,140,315 ක් පුනරාවර්තන වියදම් ලෙස ලියාහැර තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති කරුණ සමඟ එකඟ වන අතර ඉදිරි මූල්‍ය වර්ෂයේදී එය ජර්නල් සටහනක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | එක් ක්ෂය ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතුයි. |
| (ආ) | යන්ත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දැරූ රු.85,645 ක වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | ජංගම නොවන වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුයි. |

## 1.7 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය හා සබරගමුව පළාත් | ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් විස්තර ලබාගෙන කට්ටිකර විකුණන ඉඩම්වල විකුණුම් වටිනාකමින් සියයට එකක | නියමිත ඔප්පු වටිනාකම ලබා ගැනීමේ කාර්යය සංකීර්ණ කාර්යයක් වන බැවින් මේ වන විට ඒ සඳහා අවධානය යොමු කිරීමට | පනත හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | පාලන කොමසාරිස්ගේ අංක 2005/4 හා 2005 ජුනි 01 දිනැති චක්‍රලේඛයේ 3 (iv) හා 3 (x) වගන්ති | බදු මුදලක් සභාවට අයකරගත යුතු වුවත් තක්සේරු වටිනාකම මත පමණක් රු. 842,944 ක බදු මුදලක් 2015 සිට 2020 වර්ෂය දක්වා අයකරගෙන තිබුණි. | කටයුතු කරන බවත්, ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් තහවුරු කර ගනිමින් මෙහි නියමිත ඔප්පු වටිනාකම් ලබා ගැනීමට සුදුසු යාන්ත්‍රණයක් සකස් කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බවත් දන්වා තිබුණි. | |
| (ආ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 වගන්තිය | ප්‍රජාපාදක සංවිධානය/සමිතිය බල ප්‍රදේශයේ ලියා පදිංචි විය යුතු අතර කොන්ත්‍රාත් 03 කට වඩා ප්‍රමාණයක නිරතවී නොසිටිය යුතු වුවත් එයට පටහැනිව 2020 මාර්තු සිට මැයි දක්වා කාලය තුල බිසෝවෙල ගොවි සංවිධානය සමඟ රු.1,980,000 ක් වටිනාකමැති කොන්ත්‍රාත් 04 කට ගිවිසුම්ගතවී තිබුණි. | 2020 මාර්තු සිට මැයි දක්වා කාලය තුළ බිසෝවෙල ගොවි සංවිධානය සමඟ අතපසු වීමකින් කොන්ත්‍රාත් 04කට ගිවිසුම්ගත වී තිබූ බව හා රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ වගන්තියට අනුව ඉදිරියේදී කටයුතු කිරීමට වග බලා ගන්නා බවත් දන්වා තිබුණි . | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,305,512 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,333,270 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 561,245 ක් විය. මෙම ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය තුල පැවති කොරෝනා තත්වය හේතුවෙන් දේපල තහනම් කිරීමේ කාර්යය සිදු නොවූ අතර ආදායම් පරීක්ෂක තනතුරේ පවතින පුරප්පාඩු හේතුවෙන් එක් ආදායම් පරීක්ෂක වරයකු විසින් කොට්ඨාශ 03 ම ආවරණය කිරීම අපහසු බැවින් ආදායම් රැස්කිරීමේ ප්‍රමාදයන් සිදුවූ බව දන්වා තිබුණි. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

(ආ) කුලී

----

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වාහන කුලියට දීමේ හිඟ ශේෂය රු. 1,246,145 ක් විය. | වාහන කුලියට දීමේ ආදායම් හිඟව පවතින මුදල් අයකරගැනීම සඳහා අදාල ආයතන වෙත ලිඛිතව දන්වා ඇති බව දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |

(ඇ) මුද්දර ගාස්තු

--------------

| | | |
|---|---|---|
| පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ වසර 01ත් 03 ත් අතර මුද්දර ගාස්තු ශේෂය රු.3,165,812 ක් විය. | මුද්දර ගාස්තු ශේෂය අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බන්ඩාරහේන ඉඩම කට්ටි කිරීමේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ යෝග්‍යතා සහතිකය ලැබීමට පෙර අදාල ඉඩමේ පිඹුර හා කට්ටි සැලැස්ම අනුමත කර තිබුණු අතර, එසේ භූමි යෝග්‍යතා සහතිකය නොලැබූ ඉඩම් කැබලි 02 ක් විකුණා තිබුණි. එමෙන්ම වෘත්තීය වේදියකුගෙන් යෝග්‍යතා සහතිකයක් ලබා ගතයුතු බවට නිර්දේශ කර තිබූ ඉඩම් කැබලි 02 ක්ද වාර්තා ලබා ගැනීමකින් තොරව විකුණා තිබුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලැබීමට පෙර ඉඩම් කට්ටි සැලැස්ම අනුමත කර ඇති බව පිළිගන්නා අතර මේ වන විට එම ආයතනය හා අනෙකුත් රාජ්‍ය ආයතන වලින් ලබා ගත යුතු නිර්දේශ ලබා ගෙන පමණක් කට්ටි සැලසුම් අනුමත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අදාල ආයතන වලින් නිර්දේශ ලබා ගෙන ඉදිරි කටයුතු කළ යුතුයි. |
| (ආ) | අඹන්පිටිය වත්ත ඉඩමේ ඉඩම් කැබලි 17 ක් කට්ටිකර විකිණීමේදී ඉඩමේ ඇස්තමේන්තු වටිනාකම් මත අයකල යුතු සියයට 01 ක බදු මුදල රු. 217,230 ක් වුවත් ඉඩම් කැබලි 08ක් සඳහා පමණක් රු. 60,000 ක් අයකර ගැනීමෙන් රු. 157,230 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | ඉතිරි රු.157,230 ක මුදල කඩිනමින් සභාවට ගෙවන ලෙස වෙන්දේසිකරු වෙත දැනුම් දී ඇති අතර ඒ අනුව අදාළ මුදල් අය කර ගැනීමට පියවර ගන්නා බව දන්වා තිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |